# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2267/6 - 2022 පෙබරවාරි මස 14 වැනි සඳුදා - 2022.02.14**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, පුපුරුස්ස අටබාගේ ජල සම්පාදන ව්‍යාපෘතියේ වත්තහේන ඉහළ පොම්පාගාරය හා ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/KY/412.
2022 පෙබරවාරි මස 08 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

1A - G 36062 — 21 (2022/02)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1170, වත්තහේන, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අඟුරුමුල්ල ගමේ පිහිටි, "වත්තහේන" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 05 ක් පමණ වන ඉඩම් කොටස.

මායිම් :

| | | |
|---|---|---|
| උතුරට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස; |
| නැගෙනහිරට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස; |
| දකුණට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ගම්පොළ පුපුරැස්ස මාර්ගය; |
| බටහිරට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස සහ හිල්ටොප් වත්තට යන මාර්ගය. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : ඩී. එම්. අබේරත්න මයා,
අඟුරුමුල්ල,
වත්තහේන,
අටබාගේ.

EOG 02 - 0469

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, අනුරාධපුර දකුණ අදියර II ජල සම්පාදන ව්‍යාපෘතියේ, ජල කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/04/AD/413.
2022 පෙබරවාරි මස 08 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

උතුර මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 311, පරසන්ගස්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අඬුකැටියාව ගමේ පිහිටි, "ගොඩ ඉඩම" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 65 ක් පමණ වන ඉඩම් කොටසඃ

මායිම් ඃ

| | | |
|---|---|---|
| උතුරට | ඃ | කේ. එච්. ධර්මදාස හිමිකම් කියන ඉඩම; |
| නැගෙනහිරට | ඃ | පෙර පාසල හා මාර්ගය; |
| දකුණට | ඃ | එච්. එම්. ගුණසේකර හිමිකම් කියන ඉඩම; |
| බටහිරට | ඃ | කේ. එච්. රත්නායක හිමිකම් කියන ඉඩම |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය ඃ කේ. ජී. ආනන්ද කරුණාරත්න,
කොඩිතුවක්කු පාර ගෙදර,
අඬුකැටියාව,
පරසන්ගස්වැව.

EOG 02 - 0470

---

**ශුද්ධි පත්‍රය**

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය**

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, 2021.09.27 දිනැති අංක 2247/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවේ අංක 10-96 යටතේ පළ කරන ලද නිවේදනයේ ඉඩමේ ප්‍රමාණය අක්කර 01 රූඩ් 02 ක් යනුවෙන් සඳහන් වුවත්, එහි ප්‍රමාණය "**අක්කර 01**" ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය ඃ DVP/02/01/KY/102.
2022 පෙබරවාරි මස 08 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

EOG 02-0468

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.